# 17 වන දවස

## "ඔබගේ රාජ්‍යය පැමිණේවා !"

ක්‍රිස්තුන් වහන්සේ ධර්මදූතික සේවය මඟින් ආරම්භ කළේ අලුත් ආගමක්වත්, දර්ශනයක්වත් නොව; නව රාජ්‍යයකි. එය ස්වර්ග රාජ්‍යය හෙවත් දෙවියන් වහන්සේගේ රාජ්‍යය වශයෙන් හඳුන්වා දී ඇත. ඔවුන් වහන්සේගේ ඉගැන්වීම් මෙන් ම උපමා කතා මේ රාජ්‍යය ගැන ය.

ස්වර්ගය යන වචනය නව ගිවිසුමේ ව්‍යවහාර වන්නේ විශේෂ අර්ථයකිනි. එම වචනය යොදා තිබෙන්නේ, ඇතැම් ආගම්වල මෙන්ත නොයෙක් ස්වර්ග ලෝකවල් අඟවන පිණිස නොව අධ්‍යාත්මික ලෝකයක් අඟවන පිණිස ය. ඒ වනාහි මොලොව ජීවිතයක් පරලොව ජීවිතයක් අඩංගුකර ගත් ආධ්‍යාත්මික ජීවිතයකි. ඒ ජීවිතයේ පදනම නම් දෙවියන් වහන්සේගේ පාලනය පිළිගැනීම ය. ඒ නිසයි දෙවියන් වහන්සේගේ රාජ්‍යය කියා යෙදී ඇත්තේ. එයින් අදහස් කරනුයේ මනුෂ්‍ය ජීවිතයේත්, ඉතිහාසයේත්, විශ්වයේත් ඉරණම දෙවියන් වහන්සේගේ කැමැත්ත අනුව ක්‍රියා කර අන්තිමේදී පරිසමාප්තියට පමුණුවනු ලබන බවත් ය. දෙවියන් වහන්සේගේ පාලනය පිළිගෙන; ඔවුන් වහන්සේ සරණ ගොස්; දේව කැමැත්ත අනුව ජීවත්වීම ස්වර්ග රාජ්‍යය හෙවත් දේව රාජ්‍යය නම් වේ.

ස්වර්ග රාජ්‍යය දේශපාලනමය රාජ්‍යයක් නොවේ, එහෙත් එය මෙලොව ජීවිතයට අදාළ වන රාජ්‍යයකි. දෙවියන් වහන්සේගේ පාලනය මොලොව ජීවිතයටත් මෙලොවින් එහා ජීවිතයටත් සාධාරණය. ඒ නිසා එය දෙලොවටම අයිති රාජ්‍යයකැයි කිව හැක. **"ඔබගේ රාජ්‍යය පැමිණේවා"** කියා කිතුනුවන් යාච්ඤා කරන්නේ එබැවිනි (ක්‍රිස්තියානි විමුක්ති මාර්ගය 281 වන පිටුව).

**දවස පුරා :-** ✵ ''ඔබගේ රාජ්‍යය පැමිණේවා !''
✵ ශු. මතෙව් 13:44-52
✵ ගීය :- ''සැමට පළමු දෙව් රජය සොයවු...''